ගෝලීය ශ්‍රී ලාංකික සංසදය
GLOBAL SRI LANKAN FORUM

Executive Committee – UAE Chapter

MIDDLE EAST | EUROPE | AUSTRALIA | NORTH AMERICA

2021 මාර්තු 8

**ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා**
**තරුණ හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍ය**
**ඩුබායි හා උතුරු එමීරයේ ශ්‍රී ලංකාවේ කොන්සියුලේට් ජනරාල් කාර්යාලය**
**තැ. පෙ. 51528**
**ඩුබායි - එක්සත් අරාබි එමීරය**

**<u>අපේ රණවිරුවන් බටහිරට යුද අපරාධකරුවන් ලෙස පැවතීමෙන් මුදවා ගැනීම</u>**

මහත්මයාණෙනි,

2016 වසරේ සිට අප සංගමයේ මූලික අරමුණවූයේ ජිනීවා මානව හිමිකම් කොමිසම සහ පසුගිය යහපාලන රජය එකතුව උල්ලංඝණය කරන ලද ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවල සාමාජිකයන්ගේ හා දේශපාලන අධිකාරියේ මානව හිමිකම් රැකදීමට කටයුතු කිරීමයි. රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස එම කාර්ය මනාලෙස අප ඉටුකල අතර මින් ඉදිරියට ඇති කාර්යභාරය සෘජුවම රජය වෙතින් ඉටුවියයුතු බව අපගේ වැටහීමයි.

**<u>මෙම ලිපියේ අරමුණ වන්නේ මානව හිමිකම් කවුන්සිලයේ 2021 පෙබරවාරි 22 දින සිට 2021 මාර්තු 19 දින දක්වා පැවැත්වෙන 46 වැනි සැසිය සඳහා ඉදිරිපත් කෙරුන අංක A/HRC/46/20 දරණ 12/1/2021 දාතමින් නිකුත් කරණ ලද ශ්‍රී ලංකාවට අදාල මහකොමසාරිස්ගේ වාර්තාව පිළිබඳව උද්ඝෘතයට අදාලව අපගේ අදහස් ඉදිරිපත් කිරීමයි.</u>**

විදේශ කටයුතු පිළිබඳව අමාත්‍ය දිනේශ් ගුණවර්ධන මැතිතුමා විසින් පසුගිය දින එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම ඉදිරියේ සිදුකරණ ලද ප්‍රකාෂය, එනම්, මහ කොමසාරිස් වරියගේ 46/20 චෝදනා එක එල්ලේ ප්‍රතික්ෂේප කිරීම, අප ඉතා ගවුරවයෙන් පසසන්නෙමු. එසේම අප රටට විරුද්ධව ගෙනෙන කුමනහෝ චෝදනාවකට හෝ යෝජනාවකට විරුද්ධ වන ලෙස අනෙකුත් රටවලින් විවුර්තව කල ඉල්ලීම ඉතා කාලෝචිත සහ ප්‍රශංසා සහගත බවද ප්‍රකාෂ කරනු කැමැත්තෙමු.

එහෙත්, 30/1 හි සඳහන් නිර්දේශ හොඳින් ක්‍රියාත්මක කරන බව හා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව වගවීම සහ ප්‍රතිසන්ධානයට අදාළ සියළු පියවර ගන්නා බවට ප්‍රතිඥා ලබා දීම පිළිබඳව හා කුමක් පාදක කරගෙන අප රටට සහයෝගය දිය යුතුවේද යන්න ප්‍රකාෂ නොවීම පිළිබඳව අපගේ අදහස් ප්‍රකාෂ කිරීමට කැමැත්තෙමු.

30/1 හි සඳහන් නිර්දේශ හොඳින් ක්‍රියාත්මක කිරීම යනු පසුගිය රජය විසින් පාර්ලිමෙන්තු පනත් මගින්ම එකඟවූ පරිදි:

- අතුරුදහන් වූවන්ගේ කාර්යාලය පවත්වාගෙන යෑම;
- අතුරුදහන්වීම වැලැක්වීමේ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනතට අනුව කටයුතු කිරීම (මේ යටතේ ජාත්‍යන්තර අධිකරණයට යැමට විදේශ විනිසුරුන්හට අධිකරණයට බලපෑම් කිරීමට හැකියාව ඇත) ;
- වින්දිතයින් ආරක්ෂා කිරීමේ පනත පවත්වාගෙන යෑම;
- උදර්පන පනත් දෙක (පොදු රාජ්‍යය මණ්ඩලීය සහ සර්ව ලෝක පනත) පවත්වාගෙන යෑම; සහ
- ත්‍රස්ථවාදීන්ගේ පවුල් වලටද වන්දි ගෙවීමේ පනත පවත්වාගෙන යෑම ආදිය

හොඳින් ක්‍රියාත්මක කිරීමට වත්මන් රජයද ක්‍රියාකරණු ඇතැයි යන්න ගම්‍ය වේ. ඊට අමතරව තව සිදු කිර්මට ඇති කරුණු වන්නේ:

- සත්‍ය සෙවීමේ සහ වග වීමේ කොමිසම පිහිටුවීම;
- හයි බ්‍රිඩ් අධිකරණය පිහිටුවීම; සහ
- බලය බෙදන ආකාරයට කළයුතු ව්‍යවස්ථා සංශෝධනයයි.

**අපගේ අදහස වන්නේ මෙයින් රණවිරුවන්ට සිදුවී ඇති අසාධාරණය , ඔවුන්ගේ මානව අයිතිවාසිකම් කඩවීම හා ඔවුන් වෙනුවෙන් ස්වභාවික යුක්තිය ඉල්ලා රජය කටයුතු කරණ ආකාරයක් ඉන් ගම්‍ය නොවන බවයි. එසේම මේ වන විට රට රට වලට ඒක පාර්ෂවීයව ක්‍රියා කළ හැකිලෙස ඉඩ සළසා දී ඇති ප්‍රතිඥා හා ප්‍රතිපාදනද ඉන් ඉවත් නොවන බවයි.**

මෙහි ඇති බරපතල තත්ත්වය වන්නේ අපේ රණවිරුවන් බටහිරට යුද අපරාධකරුවන් ලෙස පවතින තාක් කල් දෙමල ත්‍රස්ථවාදී ලැදි ඩයස්පෝරාවේ කුලී හොරණෑකරුවන් හට අපේ රටට තදබල ලෙස බලපෑම් කිරීමට ඇති හැකියාවයි. මේ සඳහා නවතම උදාහරණය වන්නේ ශ්‍රී ලංකා හමුදාවේ යුද අපරාධ චෝදනා එල්ල වී ඇති නිලධාරීන් විසි අට දෙනෙකු වන පිරිස අපතයන් බව දක්වමින් එක්සත් ජාතීන්ගේ හිටපු නිලධාරිනී යස්මින් සූකා ජිනීවා මානව හිමිකම් කොමසාරිස්වරියට වාර්තාවක් ගොනුකර තිබීමයි. අපතයන් යන වචනය එහි සිංහල පරිවර්තනයේ කෙළින්ම සඳහන් කර ඇති අතර මෙම වාර්තාවෙන් ඇය දක්වා ඇත්තේ මේ "අපතයන්" අනිවාර්යයෙන්ම ජාත්‍යන්තර අධිකරණයට ගෙන යා යුතු බවයි.

රටවල් විසි එකක් අපට සහයෝගය දක්වා ප්‍රකාෂ නිකුත් කිරීම හා නෙස්බි සාමිවරයා විසින් 46/20 ගර්භාවට පත්කර ඇති වාතාවරණයක් තුල මානව හිමිකම් කොමිසම තම දූෂ්‍ය චෝදනා බාල කිරීමකට පත් කර නව යෝජනා මාලාවක් ඉදිරිපත් කිරීමට සූදානම් වන මේ අවස්ථාවේ ඉන් නිසි ප්‍රයෝජනය ලබනු පිණිස රජය විසින් පහත සඳහන් යෝජනා ඉදිරිපත්කර සම්මත කරගැනීමට කටයුතු කරනමෙන් ඉල්ලා සිටිමු. ඒවානම්:

- OISL වාර්තාව බරපතල ලෙස දෝෂ සහිත වන අතර, ප්‍රතිවිරෝධතා, අතපසු කිරීම්, මුසාවන්, අපැහැදිලි කිරීම් සහ අර්ධ සත්‍යයන් මගින් සංලක්ෂිත බව ප්‍රකාෂ කිරීම, එසේම නිදහසට කරුණු ඉදිරිපත් කිරීම පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොමැති බව ප්‍රකාෂ කිරීම, එහි සමුච්චිත බලපෑම නම් වාර්තාව එහි මූලික චෝදනා තහවුරු කිරීමට අසමත් වී ඇති බව ප්‍රකාෂ කිරීම;
- රණවිරුවන්ට ස්වභාවික යුක්තිය නිශ්චය සඳහා අවස්ථාවක් ඉල්ලීම;
- OISL නිර්දේශ අනුව පසුගිය රජය මගින් සම්මත කරන ලද අන පනත් පසුගිය ජනවරම මගින් අහෝසි කර ඇති බව ප්‍රකාෂ කිරීම;

- ත්‍රස්ථවාදීන්හට වන්දි ලබාදීමට අවශ්‍යානම් පිටරටවල ඇති LTTE හා සම්බන්ධ අරමුදල් සියල්ලම අප රජයට ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටීම;
- ඉන්දියා සාගර කළාපය 1976 දී සම්මත කරණ ලද ආකාරයට සාම කළාපයක් ලෙස පවත්වා ගැනීම තහවුරු කරන මෙන් ඉල්ලා සිටීම;
- ශ්‍රී ලංකාව විසින් ගෙනයන ලද මානුෂික මෙහෙයුම ඇගයීම හා ඉන් පසුව සිදුකරණලද ත්‍රස්ථවාදීන් පුනරුත්ථාථනය ආදිය අගයන මෙන් ඉල්ලා සිටීම;
- LTTE සංවිධානය විසින් වැඩිහිටියන් පැහැරගෙන යෑම විමර්ෂණය (OISL පිටු 128-131) කරන මෙන් ඉල්ලා සිටීම;
- LTTE සංවිධානය විසින් ත්‍රස්තවාදී කටයුතු වෙනුවෙන් ළමුන් බඳවා ගැනීම සහ භාවිතා කිරීම විමර්ෂණය (OISL පිටු 132-144) කරන මෙන් ඉල්ලා සිටීම; හා
- LTTE සංවිධානය විසින් සිවිල් වැසියන් මිනිස් පළිහක් ලෙස රඳවා ගැනීම විමර්ෂණය (OISL පිටු 177-184) කරන මෙන් ඉල්ලා සිටීම.

අපගේ මෙම යෝජනා රජයේ අවධානය සඳහා යොමු කරනමෙන් කරුණාවෙන් ඉල්ලා සිටින්නෙමු.

මෙයට
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය - විධායක කමිටුව

යසස් ධර්මදාස
විධායක කමිටු ලේකම් හා විධායක කමිටුවට අනුබද්ධිත ශාඛාවේ සභාපති

සමන්ත වීරමන්ත්‍රී
විධායක කමිටු සාමාජික හා විධායක කමිටුවට අනුබද්ධිත ශාඛාවේ ලේකම්

රන්ජන් සහබන්දු
විධායක කමිටු සාමාජික හා විධායක කමිටුවට අනුබද්ධිත ශාඛාවේ භාණ්ඩාගාරික

ඇමුණුම්:

- **කොන්සල් ජනරාල්තුමාට බාරදෙන ලද ලිපිය**
- **මහජන පෙත්සමේ මූලික ලිපිය**
- **මහජන පෙත්සම (අත්සන් සහ සටහන් සහිතව)**
- **විරුවන්ගේ විත්ති වාචකය (**2017 **වසරේදී ජිනීවා වත බාර දෙන ලද හා පාර්ලිමේන්තු මංත්‍රී ගරු මොහොම්මඩ් මුසම්මිල් මහතා විසින්** 2020 **දි හැන්සාඩ් ගතකරන ලද වාර්තාව)**
- **සිවිල් වැසියන්ගේ මරන පිළිබඳව ටැමිල්නෙට් ආස්ශ්‍රිතයෙන් පිළියෙල කල වාර්තාව (යුද්ධයේ අවසාන අවදියේදී සිදුවූ** සිවිල් ජනයාගේ මරණ පිළිබඳව **2018** වසරේදි නෙස්බි සාමි වරයාට ලබාදුන් වාර්තාව)

පිටපත්:
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය - විධායක කමිටුව
ජනමාධ්‍යය